


හෙටට යෙදෙන 76 වැනි ජාතික නිදහස් සමරුව නිමිත්තෙනි

# ලාංකේය නිදහස දිනා දුන් සදාතනික විරුවන් අගයමු

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආරිය ලගමුව
රජරට විශ්වවිද්‍යාලය


පොන්නම්බලම් රාමනාදන්


කුඩාපොළ හිමි

එදවස දිනූ නිදහස විඳ ගැහැට නොයෙක්
පණ නල පුදා විරුවන් ජය නඟා දැයක්
මෙදවස සිතට විරි ගෙන එක ලෙසින් මිටක්
එකමුතු වෙලා අපි හදමු අලුත් රටක්

පසිඳු මිහිරාන් රැටියල


ඩී. එස්. සේනානායක


රත්මලානේ ධර්මාරාම හිමි


එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක


මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි


ඩී.බී. ජයතිලක


ටී.බී. ජයා

එදා මෙදාතුර ලංකා ඉතිහාසයේ ගමන් මග තුළ සුවිශේෂී සන්ධිස්ථානයක් පසු කළ කාලපරිච්ඡේදයකි යටත් විජිත යුගය. මේ කාලසීමාව රටක් යටත් විජිතයක්ව පැවති යුගයක් ලෙස හුවා දැක්වීමට වඩා ලක් මාතාවගේ ස්වාභිමානය සහ නිදහස වෙනුවෙන් ඇගේ වීරෝදාර දූ පුතුන් දිවි දෙවැනි කොට පරාධීනත්වයේ බැමි සිඳලා එඩිබලයෙන් නැඟී සිට ජාතියේ වීරපරාක්‍රමය ස්වෛරීත්වය ලොවට කියා පෑ සුවිශේෂී කාලරාමුවක් ලෙස හුවා දක්වනු වටී.

පරදේශක්කාරයින්ට හිස නමමින් නිවට ලෙස දිවි ගෙවනවාට වඩා ජාති වාත්සල්‍යයෙන් ඔද වැඩී රට ජාතිය වෙනුවෙන් දිවි දුන්හ ද කම් නැතැයි සිතූ හෙළ දෙරණේ වීරවරයින් අනුස්මරණයට නිදහස් සටන යළි යළිත් සැමරීම වනාහි උත්තුංග කෘතගුණයකි. මේ දිගහැරුම ඒ අනුස්මරණීය වූ ජාතික සටනේ පුරෝගාමීන් ගැනය.

1815 කන්ද උඩරට ඉංග්‍රීසින් විසින් යටත් කර ගැනීමෙන් පසු අහිමි වූ නිදහස යළි ලබා ගනු වස් කළ නිදහස් සටන අදියර දෙකක් යටතේ හඳුනාගත හැකිය. එනම් 1818 ඌව වෙල්ලස්ස කැරැල්ල සහ 1948 පූර්ණ නිදහසක් වෙනුවෙන් මෙහෙය වූ නිදහස් සටනයි. 1815 මාර්තු මස 15 වැනි දින මඟුල් මඩුවේදී අත්සන් කළ පරාධීනත්වයේ ගිවිසුමට යෝජිතව පැවතියේ මාර්තු මස 02 වෙනි දිනය. නමුත් ඉංග්‍රීසින් සහ සිංහලයින් අතර මතුවුණු ගැටුම් ඊට බාධාවක් විය.

ඉංග්‍රීසීන්ගේ ධජය බිම දමා දෙපතුලෙන් පාගා යළි සිහළ ධජය ගුවනේ ලෙළ දෙන්නට මඟ සැලසූ වාරියපොළ ශ්‍රී සුමංගල හිමියෝ නිදහස් සටනේ පළමු අදියරේ ආරම්භක අද්විතීය රණවිරුවාණෝය. උන්වහන්සේගේ ක්‍රියාකලාපය නිද්‍රෝපගතව සිටි හෙළයා අවදි කරනු වස් කළ වීර ක්‍රියාවකි. එතැන් සිට සුමංගල හිමියෝ වටා එඩිතර සිහළ පරපුරේ ඇත්තෝ කඳවුරු ගොඩනැඟූ බැව් ඉතිහාසය පෙන්වා දෙයි.

උත්තුංග දළදාව හිමිවන්නේ කාට ද එතැනැත්තාට ලංකා රාජ්‍යයේ රාජ්‍ය බලය හිමිවන බවට වූ පිළිගැනීමෙන් සුද්දා අනිසි ප්‍රයෝජනයක් ගනු ඇතැයි සිතූ සුමංගල හිමියෝ දළදාව පණ සේ රැක ගනිමින් සතුරන්ට රාජ්‍ය බලය හිමිවීමට තිබූ සාම්ප්‍රදායික නියමයට වැට බැන්දහ.

සුමංගල හිමියන්ගෙන් පණ පෙවුණු නිදහස් සටන එතැන් සිට 1948 නිදහස ලබා ගන්නා තුරු වූ ගමන් මගේ වීරවරයන් නවසිය පනහත් දහසත් අතර පිරිසක් පෙරමුණේ නායකකාරකාදීන් ලෙස කටයුතු කර ඇත. ප්‍රකට වූ චරිතවලට වඩා කුප්‍රකට චරිත මෙපමණකැයි කිව නොහේ. කෙසේ වුව ප්‍රකට වූ නම් ගොත් ඇත්තෝ මෙසේ ගෙන හැර දක්වමු.

ඉහළගම රතනසාර, වැලිවිට සරණංකර, මිගෙට්ටුවත්තේ ගුණානන්ද, හික්කඩුවේ ශ්‍රී සුමංගල, බත්තරමුල්ලේ ශ්‍රී සුභූති, රත්මලානේ ශ්‍රී ධර්මාරාම, කුඩාපොළ හාමුදුරුවෝ වැනි සඟ පරපුර පංච මහා විවාදයන් පවත්වමින් බුදුදහම වැනසීමට ගත් සියලු තැත පරදවනු වස් දිවිහිමියෙන් නිදහස් සටනේ මුරදේවතාවෝ ලෙස ක්‍රියා කළහ.

සංඝයා වහන්සේ එසේ ක්‍රියාවෙන් නිදහස් සටන මෙහෙයවද්දී රට ජාතිය වෙනුවෙන් රත් වූ සිහළ ලේ ඇති සුජාත වීර පුතුන් සතුරු බළමුළු පරයා පෙරමුණට වන්හ. නිදහස් සටනේ සෙසු පුරෝගාමීන් සිහළ ප්‍රභූ පරපුරේ නම් ගොත් ඇත්තෝය. වීර කැප්පෙටිපොළ, මඩුගල්ලේ නිලමේ, ඇල්ලේපොළ නිලමේ, පිළිමතලව්වේ අධිකාරම්, ආඳාවල මොහොට්ටාල, අඹගොල්ලේ රාල, කොහුකුඹුරේ රටේ රාල, මීගස්පිටියේ බෝගහගෙදර රාල, කිවුලේගෙදර මොහොට්ටාල, කැටකුඹුරේ නිලමේ, මාළිගයේ විදානේ, බූටෑවේ රටේ රාල, විල්බාගෙදර දුක්ගන්නා රාල, වීර පුරන්අප්පු, ගොන්ගාලේගොඩ බණ්ඩා, වීදියබණ්ඩාර, මඩුවන්වෙල රටේ මහත්තයා ආදී වීරවරයෝ ලංකා ඉතිහාසයේ සිය නාමය රන් අකුරින් ලියැවූහ.

විටෙක සටන් පෙරමුණේ සතුරා සමග මුහුණට මුහුණ දී එඩි බල පෙන්වූ ජාති වාත්සල්‍යයෙන් ද ශරීර ශක්තියෙන් ද ජව සම්පන්න වූ මේ අද්විතීය ජන නායකයින්ට සටන් පෙරමුණේ දී දිවි පුදන්නට සිදු විය. සිරබත් කමින් නේක දුක් ගැහැට විඳ මියැදෙන්නට සිදු විය. කුඩා බදුල්ලගම්මන රටේ රාල, නකල්ලේ රටේ රාල, බඩල්කුඹුරේ විදානේ, මුප්පනේ රටේ රාල, වියළුවේ හාපත්ගම මොහොට්ටාල, ඌවේ වටකැලේ රටේ රාල, ඌවේ මීගමපිටියේ රටේ රාල, බිංතැන්නේ මොහොට්ටාල, මීගහරාවේ මොහොට්ටාල, කිරිඅප්පු, බකිනිගහවෙල අදිකාරම්, රඹුක්පොත දිසාව, හල්දෙණියේ මොහොට්ටාල, ඩිංගිරිඅප්පු සහ බාල අප්පු, හාමාපොළ රංකිරි, අඹගොල්ලේ රාල, මීගහපිටියේ රටේ රාල, රිතණවත්ත දේවාලයේ කපුරාල, ඌවේ ගොඩ ගෙදර අදිකාරම්, කතරගම මහබෙත්මේ, පිටදෙණියේ තිසාහාමි ආදි නම් ගොතී ඇත්තේ හෙළ සිංහලය පරගැතිභාවයෙන් මුදා ගනු වස් දිවි දුන් ජාතික වීරවරයෝය.

ඉංග්‍රීසි අධිරාජ්‍යවාදයට එරෙහිව සිය ස්වාමිපුරුෂයින් සටන් පෙරමුණට යද්දී ඔවුන් දිරිගැන්වූ සිහළ පරපුරේ කුල කාන්තාවෝ ද මේ සටනේ අවශේෂ වීරවරියෝය. ඇහැලේපොළ කුමාරිහාමි, කැප්පෙටිපොළ කුමාරිහාමි, කොහෙල්ලේ විදානේගේ සොහොයුරිය, කොහුකොටුවේ රාලගේ සොහොයුරිය, ගන්නෝරුවේ ටිකිරිගම්මනගේ, තලවත්තේ ගම්මනේ, ගජමන් නෝනා ආදී මේ දිරිමත් වනිතාවෝ සිය ස්වාමිපුරුෂයින්, සහෝදරයින්, ඥාතීන් අධිරාජ්‍යවාදයට එරෙහිව නන් ආකාරයෙන් එම වික්‍රමාන්විතයට දිරි දුන්හ.

කුමාරතුංග මුනිදාස, ටිබෙට් ජාතික ඇස්. මහින්ද හිමි, ඩබ්ලිව්. ඒ. සිල්වා, පියදාස සිරිසේන, හික්කඩුවේ ප්‍රඥාරාම, රැපියෙල් තෙන්නකෝන් වැනි උගත් බුද්ධිමත් සාහිත්‍යධරයෝ සිය කාර්යභාරය මැනවින් නොබියව ඉටු කළහ. ඉංග්‍රීසි අධිරාජ්‍යවාදී පාලනය මුග්ධ ලෙස විවේචනය කරමින් නිර්මාණකරණයෙහි නියැළුණහ.

නිදහස් සටනේ දෙවැනි අදියර වනාහි අවි දරා කළ සංග්‍රාමයක් නොවේ. දිවි පරදුවට තබමින් 'සතුරන් පරාජය කිරීමට ගත් වෑයමින් වෙනස් මගක් ගත් දෙවැනි අදියරේ නිදහස් සටනේ පුරෝගාමීහු ඉංග්‍රීසි පාලකයින් සමග දේශපාලන ප්‍රවේශයකින් නිදහස් සටනට අවතීර්ණ වූහ. ඔවුහු දේශපාලන නිදහසක් ඔස්සේ රට නිදහස් කර ගැනීමේ ක්‍රියාන්විතයකට එළැඹුණහ. ඉංග්‍රීසි පාලකයින් සමඟ සාකච්ඡාමය මාර්ගයෙන්, දූත ගමන් මඟින් සාමකාමී ප්‍රවේශයක් ඔස්සේ නිදහස යළි ලබා ගැනීමට දායක විය. ලේ බිඳක්වත් නොසොල්වා 1948 ලබා ගත් දේශපාලන නිදහසේ පුරෝගාමීන් අතර ඩී. එස්. සේනානායක, එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක, ටී. බී. ජයා, ඩී. බී. ජයතිලක, පොන්නම්බලම් රාමනාදන්, පොන්නම්බලම් අරුණාචලම්, ඊ. ඩබ්. පෙරේරා, එෆ්. ආර්. සේනානායක යන නායකයෝ මුල් පෙළේ පසු වෙති. නිදහස් සටනේ දී ජාති, ආගම් භේද නොතකා රට ජාතිය සමය වෙනුවෙන් පවුරු බැඳගත් මේ ජාති හිතෛෂීන් 1948 පෙබරවාරි 4 දා අත්කර ගත් නිදහසේ දාවැන්තයෝය.

සකුන්තලා ජයසිංහ
අඹන්පොල විශේෂ